රත්තොට ප්‍රාදේශීය සභාව
මාතලේ දිස්ත්‍රික්කය
-----------------------------

1. මූල්‍ය ප්‍රකාශන
------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 අප්‍රේල් 06 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 මැයි 19 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

1.2 තත්ත්වාගණනය කළ මතය
-----------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට රත්තොට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) 2014 හා 2015 වර්ෂ තුළ හා සමාලෝචිත වර්ෂය තුළ ඉදිකර තිබුණු ගොඩනැගිලි 3ක වටිනාකම වූ රු.36,269,045 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ආ) ප්‍රාග්ධන වැය රු. 208,422 ක් හා වැටුප් ප්‍රතිපූර්ණ රු.1,786,645ක් වැඩියෙන් ගිණුම්ගතකර තිබුණි.

(ඇ) රු.10,000,000 ක ස්ථිර තැන්පතුව සඳහා වර්ෂයට අදාළ පොලිය වූ රු.200,000 ක් මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දැක්වුණි.

(ඈ) ණය නිරවුල් වී තිබූ නමුත් නිකුත් නියෝග සටහන් නොමැති වීම නිසා රු.3,058,938ක් ගබඩා ණය හිමි ශේෂය වැඩියෙන් දැක්වුණි.

(ඉ) භෞතික පැවැත්මක් නොමැති ගොඩනැගිලි 6ක එකතු වටිනාකම රු.634,455ක් රු.847,322ක පුස්තකාල පොත් ශේෂයක් වැඩියෙන් දැක්වුණි.

(ඊ) උකුවෙල ප්‍රාදේශීය සභාවෙන් ලැබී තිබූ රු.128,429ක් වටිනා ගැල්වනයිස් බට 116ක් මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණි.

1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

----------------------------

(අ) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.38,655,887 ක් වූ ගිණුම් විෂයන් 4 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන හා වාර්තාවල දැක්වෙන ශේෂයන් අතර රු.2,685,860 ක වෙනසක් පැවතුණි.

(ආ) ප්‍රාග්ධන යෙදුමෙන් ආදායමට දායකවීමේ ගිණුමේ ශේෂය හා ස්ථාවර වත්කම් ගිණුමේ ශේෂය අතර රු.775,666 ක වෙනසක් පැවතුණි.

1.3.3 අවිනිශ්චිත ගිණුම

---------------------

වසර 19ක සිට අවලව ඉදිරියට ගෙන එමින් පවතින රු.15,462 ක් වූ අවිනිශ්චිත ගිණුමේ ශේෂය නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි.

1.3.4 ලැබිය යුතු ගිණුම්

---------------------

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 10 ක එකතුව රු.38,434,702 ක් වූ අතර, වර්ෂ 5 කට වැඩි කාලයක් ඉක්මවූ එකතුව රු.4,299,150 ක ශේෂ ඊට ඇතුළත්වී තිබුණි.

1.3.5 ගෙවිය යුතු ගිණුම්

--------------------

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 2 ක එකතුව රු.28,575,594ක් වූ අතර, වර්ෂ 5 කට වැඩි කාලයක් ඉක්මවූ එකතුව රු.1,879,963 ක් වූ ශේෂ ඊට ඇතුළත් වී තිබුණි.

1.3.6 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම

-------------------------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.123,803,288 ක්වූ ගිණුම් විෂයයන් 7 කට අදාළ වූ ශේෂ සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.7 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

------------------------------------------------

පහත විස්තර දැක්වෙන නීති, රීති හා රෙගුලාසි විධිවිධානවලට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේ දී නිරීක්ෂණය විය.

| නීති,රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (3) 1 වගන්තිය | විධිමත්ව පිළියෙල කළ ඉන්වෙන්ට්‍රිගත මාර්ග ගැසට් පත්‍රයේ පල කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාව | |
| (i)203 රීතිය | සභාව සතු ගබඩා භාණ්ඩ, ඉන්වෙන්ට්‍රි භාණ්ඩ සම්බන්ධයෙන් භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |
| (ii)218 රීතිය | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධව 1987 වර්ෂයේ සිට සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |

(ඇ) චක්‍රලේඛ හා වෙනත්

-------------------------

| | |
|---|---|
| i. මධ්‍යම පළාත් පළාත් පාලන කොමසාරිස්ගේ අංක 2016/3 හා 2016 මාර්තු 17 දිනැති චක්‍රලේඛයේ 5.1 ඡේදය | වසර 5 කට වරක් කඩ කාමර බදු කුලී තක්සේරු කොට සංශෝධනය සහිතව ගිවිසුම් වලට එළඹ නොතිබුණි |
| ii. 1986 ජුනි 17 දිනැති අංක 1986/6 දරන පළාත් පාලන දෙපාර්තමේන්තු චක්‍රලේඛය | - සභාව මහජන බැංකුවට ලබාදුන් බිම් කොටස වර්ෂ 50ක කාලයක් සඳහා දීර්ඝ කාලීනව බදුදී තිබූ අතර,ඒ සඳහා විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතියද ලබාගෙන නොතිබුණි.<br>- 2009 වර්ෂයේ සිට නිවැරදි තක්සේරුවක් ලබා නොගෙන රු.8,000 ක මාසික බදු කුලියක් අයකරමින් පැවතුණි. |

2. මූල්‍ය සමාලෝචනය

----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු 16,758,888 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම 14,254,378 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු 2,504,510ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය.

-----------------------------------

මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනය සඳහා ආදායම් විෂයයන් 2ක රු. 4,308,443ක ආදායම වැඩිවීම හා වියදම් විෂයයන් 2ක රු. 2,104,978ක වියදම අඩුවීම බලපා තිබුණි.

2.3 ආදායම් පරිපාලනය

---------------------

2.3.1 වරිපනම්

----------

(අ) රු.761,564 ක් වූ හිඟහිටි වරිපනම් බදු ශේෂය තුල වසර 1 ත් 5 ත් අතර කාලයක් ඉක්මවූ රු.729,332 ක ශේෂ ඇතුළත්ව තිබූ අතර නිසි ලෙස දේපල හඳුනා නොගැනීම මත 2012 වර්ෂයේ සිට පැවත එන අයකරගත නොහැකි වූ රු.193,255 ක වරිපනම් බදු මුදලක් ද පැවතුණි.

(ආ) දීර්ඝ කාලීන හිඟ වරිපනම් බදු සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1) වගන්තිය ප්‍රකාරව කටයුතුකර නොතිබුණි.

(ඇ) රජයේ ආයතනවලින් අයවියයුතු ලෙස රු.108,273 ක් දැක්වුවද එම ගොඩනැගිලි භෞතිකව හඳුනාගෙන නොතිබුණු අතර, තක්සේරුවට යටත් නොවූ දේපල 14 කට අයත් නිකවැල්ල පාරේ නිවාසවලින් අයවියයුතු රු.264,745 ක වරිපනම් ශේෂයක් ද අයකරගත නොහැකි තත්වයක පැවතුණි.

2.3.2 බදු කුලී

--------

(අ) හිඟහිටි බදුකුලී ශේෂය රු.761,470 ක් වූ අතර 2017 ජූනි 14 දින වනවිට ඉන් රු.285,538 ක ශේෂයක් අයවීමට තිබුණි.

(ආ) සභාවට අයත් නොවූ ඉඩමක සභාව වෙනුවෙන් රීප් ව්‍යාපෘතිය යටතේ ඉදිකර දී තිබූ කඩකාමර 5 ක් සහිත භූමිය ඉදිකිරීම් කර වර්ෂ 6කට ආසන්න කාලයක් ගතවනතුරුත් සභාව නමට පවරා ගැනීමට කටයුතුකර නොතිබීම හේතුවෙන් නැවත ප්‍රාදේශීය ලේකම් වෙත භාරදී කඩ කාමර ඉවත් කිරීමට සිදුවී තිබූ අතර, 2016 අගෝස්තු සිට සභාවට ලැබුණු කඩකුලී ආදායම අහිමි වී තිබුණි.

(ඇ) 2006 වර්ෂයේ පොලීසියට ලබාදුන් පොලිස් නිල නිවාස හා පොලීසිය පිහිටි ගොඩනැගිල්ල තක්සේරු නොකර 2006 වර්ෂයේ තීරණයකළ පිළිවෙලින් රු.650ක්වූ හා රු.3,500 ක් වූ මාසික කුලී පදනම යටතේ ලබාදී තිබුණි.

2.3.3 බලපත්‍ර ගාස්තු

----------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි බලපත්‍ර ගාස්තු ශේෂය රු.405,685 ක් වූ අතර එය වර්ෂ 5 කට පෙර සිට පැවත එන ශේෂයක් විය.

2.3.4 වෙනත් ආදායම්

-------------------

(අ) අක්කර බදු

---------------

සමාලෝචිත වර්ෂය අවසානයට හිඟහිටි අක්කර බදු ශේෂය රු.349,673 ක් වූ අතර එම ශේෂයට වර්ෂ 1 ත් 5 ත් අතර කාලයක් ඉක්ම වූ රු.327,813 ක ශේෂ ඇතුළත්ව තිබුණි.

(ආ) ජල ගාස්තු

-------------

(i) සමාලෝචිත වර්ෂයේ බිල්කිරීම් රු.7,211,011 කින් වර්ෂය තුළ රු.1,957,875ක මුදලක් පමණක් අයකරගෙන තිබූ අතර එය බිල්කිරීමෙන් සියයට 27 ක අගයක් විය. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි ජල ගාස්තු ශේෂය රු.6,624,398ක් තරම් ඉහළ අගයක් විය.

(ii) ජල පාරිභෝගිකයින් 3458 දෙනෙකුගෙන් ජලමනු සවි කිරීමකින් තොරව ස්ථාවර මාසික ගාස්තුවක් අයකරමින් පැවතුණි.

2.3.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

------------------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.843,000ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු.10,916,723 ක මුදලක් අයවිය යුතුව තිබුණි.

2.4 අධිභාර

--------

ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව ඉකුත් වර්ෂ වලදී පනවන ලද අධිභාර වලට අදාළව රු.9,543,067ක මුදලක් අයවිය යුතුව තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

-------------------------

3.1 කාර්යසාධනය

-----------------

පුරනැගුම ව්‍යාපෘතිය යටතේ ඉදිකරන ලද සතිපොල ගොඩනැඟිල්ල භාවිතා කිරීමට කටයුතු කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ අයවැය ප්‍රතිපත්ති ප්‍රකාශයේ දක්වා තිබූ කුරුවාව ළමා උද්‍යානයේ බිම් සකස් කිරීම ඉටුකිරීමට කටයුතු කර නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) ස්ථානමාරුවී ගිය, විශ්‍රාම ගිය, සේවය අතහැර ගිය, මියගිය නිලධාරීන්ගේ ණය ශේෂවූ රු.522,195 ක් ද අයකර ගැනීමට ද කටයුතු කර නොතිබුණි.

(ආ) 2000 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා කාලයට අදාළ රු.2,624,047 ක ණයගැති ශේෂයක්, 1999 සිට 2013 වර්ෂය දක්වා වූ කාලයට අදාළ රු.406,131 ක නොපියවූ අත්තිකාරම් ශේෂයක් හා 2006 සිට 2014 වර්ෂය දක්වා කාලයට අදාළ රු.8,911,692ක ණයහිමි ශේෂයක් නිරවුල් කිරීමට කටයුතුකර නොතිබුණි.

(ඇ) අතිරික්ත කම්කරු සේවකයින් 14 ක් සිටියදීත් දෛනිකව වැටුප් ගෙවීම හා දීමනා ගෙවීම මත සේවකයින්ගේ 4 දෙනෙකු යොදවා රු.1,180,371 ක් ගෙවා තිබුණි.

(ඈ) ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව සතුව ජල ව්‍යාපෘති 11 ක් පැවති අතර ජලය පිරිපහදු නොකර ටැංකි වලින් බෙදාහැරීමක් සිදු කිරීම හේතුවෙන් කොළ රොඩු නලවල හිරවීමක් සිදුවන බැවින් ජලය බෙදාහැරීමට බාධාවන් සිදුවෙමින් පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ දෙක තුළ ලැබී තිබුණු ගොඩනැගිලි අයදුම්පත් 356 කින් අයදුම්පත් 241 ක් සඳහා අනුමැතිය ලබාදී තිබුණු නමුත් ඉන් අයදුම්පත් 12ක් සඳහා පමණක් අනුකූලතා සහතික නිකුත් කර තිබුණි.

3.4 නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

------------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) භාවිතයට ගත නොහැකි තත්වයේ පැවති රු.1,615,975 ක් වටිනා වාහන 9 ක් හා භාවිතයෙන් ඉවත්කල රු.213,000 ක් වටිනා ඡායා පිටපත් යන්ත්‍ර 2 ක් රු.159,000ක් වටිනා මුද්‍රණ යන්ත්‍ර 2 ක් හා රු.106,000 ක් වටිනා රෝනියෝ යන්ත්‍රයක් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) 2012 වර්ෂයේ මිලදීගත් රු.228,643 ක් වටිනා ජලනල උපාංග, 2014 වර්ෂයේ මිලදී ගත් රු.848,250ක් වටිනා ළමා උද්‍යාන උපකරණ හා 2014 වර්ෂයේදී රු.12,064,929ක් වැයකර ඉදිකර තිබූ සතිපොල ගොඩනැගිල්ල නිෂ්කාර්යයව පැවතුණි.

3.5 හඳුනාගත් අලාභ

-----------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 2014 නොවැම්බර් 12 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 25/2014 ට පටහැනිව දීමනා මත සේවකයින් 8 දෙනෙකුට ස්ථිර පත්වීම් ප්‍රදානය කර පසුව පත්වීම් අහෝසි කොට තිබුණි. ඒ හේතුවෙන් අදාළ සේවකයින් සභාවට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනුකර තිබූ නඩුවට අදාලව සභාවෙන් දරා තිබූ රු.325,000 ක නීතිඥ ගාස්තු නිසි උපදෙස් ලබා ගැනීමකින් තොරව හා චක්‍රලේඛවලට පටහැනිව කටයුතු කිරීම හේතුවෙන් සභාවට දැරීමට සිදුවතිබූ නිෂ්ඵල වියදමක් වී තිබුණි .

(ආ) පෞද්ගලික පාර්ශ්වකරුවෙකුගේ ඉඩමෙන් පාරක් කපා තිබීම හා 2009 වර්ෂයේදී සභා පාරක් ලෙස ගැසට් කිරීම හේතුවෙන් එකී පාර්ශවයෙන් 2010 වර්ෂයේදී මාතලේ දිසා අධිකරණයේ නඩුවක් ගොනුකර තිබූ අතර 2010 වර්ෂයේ සිට 2016 දක්වා නඩු ගාස්තු ලෙස රු.115,000 ක් ගෙවා තිබුණි.

(ඇ) සුසාන භූමියක අයිතිය තහවුරු කර ගැනීමේ ලියවිලි සභාව සතුව නොතිබීමෙන් පෞද්ගලික පදිංචිකරුවෙකු ඉඩමේ කොටසක් අල්ලාගෙන තිබූ අතර ඒ හේතුවෙන් වූ නඩුව වෙනුවෙන් නීතිඥ ගාස්තු ලෙස 2011 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා රු.76,500 ක් දරා තිබුණි.

3.6 කොන්ත්‍රාත් පරිපාලනය

--------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සභා අරමුදල් යටතේ 2015 වර්ෂයේදී කුරුවාව ළමා උද්‍යානය ඉදිකිරීම සඳහා රු.765,000ක ඇස්තමේන්තුවක් පිළියෙල කර තිබුණද අයවැය මඟින් ප්‍රතිපාදන සලසා නොතිබියදී විධිමත් අනුමැතියකින් තොරව භූමිය සකස් කිරීම සඳහා රු.330,400ක් වැයකර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ අදාළ භූමිය වල්වැදී තිබුණි.

(ආ) ප්‍රාදේශිය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ ලද රු.500,000 ක් වැයකර ජල ව්‍යාපෘතිවලට එදිනෙදා අවශ්‍ය උපකරණ මිලදීගෙන තිබූ අතර, ඒ තුළ මිලදීගැනීමේ අවශ්‍යතාවය අනාවරණය නොවූ රු.327,575 ක් වටිනා ජල උපකරණ පැවතුණි.

3.7 ව්‍යාපෘති ප්‍රමාද කිරීම

---------------------

ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ 2016 වර්ෂයේ ඉටු කිරීමට යෝජිතව තිබූ ප්‍රතිපාදන මුදල රු.3,250,000 ක් වූ ව්‍යාපෘති 6 ක් ක්‍රියාත්මක කර නොතිබුණු අතර, 2016 ජුනි වන විට ලද රු.1,000,000 ක අත්තිකාරම් මුදලින් රු.500,000 ක් වූ ජල යෝජනා ක්‍රම වල නඩත්තු හා අළුත්වැඩියාවන් සිදුකිරීමේ ව්‍යාපෘතියක් පමණක් ක්‍රියාත්මක කර තිබුණි.

3.8 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

------------------------------------

සභාව සතුව රු.2,971,053 ක් වැයකර ඉදිකරන ලද කසල කළමනාකරණ ගොඩනැගිල්ලක් පැවති අතර බල ප්‍රදේශයේ දෛනිකව එකතු වන මෙට්‍රික් ටොන් 2 ක පමණ අපද්‍රව්‍ය යොදා ගනිමින් පොහොර කිලෝග්‍රෑම් 10 ක් පමණ නිෂ්පාදනය කරමින් පැවතුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

-----------------------------------------

4.2 අයවැය පාලනය

-----------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) ආදායම් විෂයන් 9ක සියයට 58 සිට සියයට 88 දක්වා පරාසයක ඉලක්කගත ආදායම උපයා ගැනීමට සමත් වී නොතිබුණු අතර, තවත් ආදායම් විෂයන් 11ක ඇස්තමේන්තුගත ආදායම ඉක්මවා සියයට 62 සිට සියයට 4767 ක් දක්වා පරාසයක විචලනයන් පැවතුණි.

(ආ) වැය විෂයන් 11 ක් සඳහා සලසා දි තිබූ රු1,540,864 ක සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණු අතර, වැය විෂයන් 17ක ශුද්ධ ප්‍රතිපාදන සහ තථ්‍ය වියදම් අතර සියයට 55 සිට සියයට 99 දක්වා පරාසයක විචලනයක් පැවතුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ ආදායම් හා වියදම් විෂයන් අතර, ප්‍රතිපාදන මාරු කිරීමෙන් අනතුරුවද, අයවැය ගත හා තථ්‍ය ආදායම් හා වියදම් අතර සැලකිය යුතු විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

4.3 අභ්‍යන්තර විගණනය

--------------------

1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 5(7) රීතිය ප්‍රකාරව අභ්‍යන්තර විගණන ක්‍රමයක් පවත්වාගෙන ගොස් නොතිබුණි.

4.4 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම

--------------------------------------------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වාම විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීමට පියවර ගෙන නොතිබුණි.

5. පද්ධති හා පාලනය

-----------------------

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ණයගැති හා ණයහිමි පාලනය.
(ආ) කාර්ය මණ්ඩල කළමනාකරණය.
(ඇ) වත්කම් කළමනාකරණය.
(ඈ) අයවැය පාලනය.